www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී 20 සමුලුව ජාත්‍යන්තර ආතතීන් තියුනු කෙරෙන වේදිකාව සකසයි

## G20 summit sets stage for sharpening of international tensions

බැරී ග්‍රේ විසිනි

2009 සැප්තැම්බර් 26

ප්‍රමුඛ ආර්ථිකයන් 20 කන්ඩායමේ පිට්ස්බර්ග් සමුලුව, තවත් මූල්‍ය අර්බුදයක් වලක්වා ගැනීමේ හා ලෝක ආර්ථිකය පනගැන්වීමට අදාල ප්‍රතිපත්ති මත, මහා බලවතුන් අතර තියුනු වන ගැටුම් වසං කිරීම අරමුනු කරගත්, ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීමත් සමඟ, 25 වන සිකුරාදා අවසන් විය.

එක්සත් ජනපදය හා යුරෝපයත්, එක්සත් ජනපදය හා චීනයත්, ආසියාවේ හා ලතින් ඇමරිකාවේ ඊනියා නැගීඑන ආර්ථිකයන් හා වඩාත් බලගතු බටහිර ආර්ථිකයනුත් අතර මතභේදයට තුඩුදුන් ප්‍රධාන ප්‍රශ්න, සමුලු ප්‍රකාශනය තුල මඟහැර ඇති නමුදු ජාතික හා ප්‍රාදේශීය ආතතීන්, එලඹෙන සති හා මාස වලදී තවදුරටත් පැසවනු ඇති බව සහතිකය.

සමුලුව තුල ආධිපත්‍ය දැරූ අධිරාජ්‍යවාදී ආසක්තයන්, එක්සත් ජනපද ජනාධිපති ඔබාමා, ප්‍රන්ස ජනාධිපති සාකෝසි හා බ්‍රිතාන්‍ය අගමැති බ්‍රවුන් විසින්, ඉරානයට එරෙහි ඔවුන්ගේ රාජ්‍යතාන්ත්‍රික හා ආර්ථික ප්‍රහාර පුලුල් කිරීමටත්, ටෙහෙරානයට එරෙහි මිලිටරි පියවර නොවැලැක්විය හැකිය යන තර්ජනය ඉහල නැංවීමටත්, එම රැස්වීම වේදිකාවක් කර ගැනීමට ගත් තීරනය කිරීම තුලින් ප්‍රකාශ වෙයි. ඉරානය තුල ඇතැයි ඔවුන් කියා සිටි රහසිගත න්‍යෂ්ටික බලාගාර වැඩ පිලිවෙල හෙලා දැකීමටත්, අවසන් නියෝග නිකුත් කිරීමටත්, ටෙහෙරානය සමඟ ඔක්තෝබර් 01 දින පැවැත්වීමට සැලසුම් කර ඇති සාකච්ඡා වලට පූර්වයෙන්, 25 දින උදෑසන නායකයන් තිදෙන එකට පෙනී සිටි අවස්ථාවේ, ආර්ථික ප්‍රශ්න මත රාජ්‍ය නායකයන්ගේ තීන්දු හා නිගමන අඳුරුවී ගියේ ය.

සමුලුව අවසානයේ සත්කාරක ජාතියේ නායකයා ලෙස මාධ්‍ය හමුවකදී කථාකල ඔබාමා, ඉරානයේ න්‍යෂ්ටික වැඩ සටහන පිලිබඳ ප්‍රශ්නය යලි මතුකල අතර, වාර්තාකරුවන් වෙතින් නැඟුනු ප්‍රශ්න සියල්ලක්ම පාහේ යොමුවූයේ ඉරානය හා ඇෆ්ගනිස්ථාන යුද්ධය කෙරෙහිය. සමුලුව කෙරෙහි යොමුවූයේ මඳ අවධානයකි.

රැස්වීමට පෙරාතුව ම සියලු පාර්ශවයන් විසින් එකඟත්වය පලකොට තිබුන, පුනර්ජීවනය ස්ථාවර තත්ත්වයකට පත්වන තෙක් බැංකු වලට ආර්ථික උත්තේජක දීමනා හා සහන සැලසීමේ වැඩ සටහන දිගටම පවත්වාගෙන යාම හා තහවුරු වූ කාර්මික රටවල පැරනි ජී 8 කන්ඩායම වෙනුවට, ජාත්‍යන්තර ආර්ථික කටයුතු පිලිබඳ සාකච්ඡාවලදී මින් ඉදිරියට ජී 20 ප්‍රධාන කන්ඩායම ලෙස සැලකීම, සමුලුව විසින් ගත් සැලකිය යුතු ප්‍රධාන තීන්දුවයි.

පසුව කී තීන්දුවෙන් පෙන්නුම් කලේ, චීනය, ඉන්දියාව හා බ්‍රසීලය වැනි රටවල් ලෝක ආර්ථික කටයුතුවල දී දරන තැන මෙන්ම, එහි දී සිදුව ඇති එක්සත් ජනපදය හා යුරෝපය යන දෙකෙහිම සාපේක්ෂ පිරිහීම පිලිගෙන ඇතැයි යන්නය. එමෙන්ම එය, එක්සත් ජනපදය විසින් පෙරට තැබූ බොහෝ ආරම්භක පියවරයන් මෙන්ම සැලසුම්කර ඇත්තේ, ප්‍රධාන යුරෝපීය තරගකරුවන්, විශේෂයෙන්ම ජර්මනිය, සමඟ සබඳතාවන්හිදී වොෂින්ටනයේ තත්ත්වය ශක්තිමත් කර ගැනීමටය. ජී 8 වෙනුවට ජී 20 ආදේශ කිරීමේ ප්‍රතිපලයක් වශයෙන් තමන්ගේ බලපෑම වඩාත් හැකිලී යා හැකි බව දැකගන්නේ යුරෝපීය බලවතුන්ය.

ඒ හා සමානව ම, එක්සත් ජනපදයට වඩා යුරෝපීයන් මත බෙහෝ සෙයින් රිනාත්මක බලපෑමක් ඇති කල හැකි වෙනසක් සඳහා, එනම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) තුල "සංවර්ධනය වන" රටවල ඡන්ද බලය අවම වශයෙන් සියයට 5 කින් වැඩිකිරීමේ එකඟතාවක් ඇතිකර ගැනීම සඳහා එක්සත් ජනපදය පීඩනය යොදයි.

ජාත්‍යන්තර සබඳතාවන්ගේ පසුබාන සුලු තත්ත්වය, පසුගිය 25 දින "ජාමූඅ මුල්කොටගත් ආතතීන්, ජී 20 තත්ත්වයට හානිකර තර්ජනයක්" යන ෆිනෑන්ෂල් ටයිම්ස් සිරස් තලයෙන් පිලිබිඹු කරයි. යුරෝපීය නියෝජිතයන් සංඛ්‍යාව අඩුවන පරිදි, ජාමූඅ අධ්‍යක්ෂ මන්ඩලය තනතුරු 24 සිට 20 දක්වා අඩු කිරීමට එක්සත් ජනපදය විසින් 24 දින ගෙනආ යෝජනාවක් කෙරෙහි මහා බ්‍රිතාන්‍ය හා ප්‍රන්සය

දැක්වූයේ කම්පාවට පත්වූ හා කෝපාවිෂ්ට ප්‍රතිචාරයක් බව ලිපිය විස්තර කරයි. එම යෝජනාව ජාමූඅ තුල රටවල් දෙකෙහිම අධ්‍යක්ෂක මන්ඩල ආසන වලට තර්ජනයක් වනු ඇත.

එමෙන්ම *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයට අනුව, බ්‍රිතාන්‍ය හා ප්‍රන්සය ඊට ප්‍රතිචාර වශයෙන්, දැනට එක්සත් ජනපදය සතුව ඇති නිෂේධ බලය ද ඇතුලු ජාමූඅ පාලනයට අදාල සියලු ප්‍රශ්න, සාකච්ඡා කල යුතු බවට තර්ක කලහ. මේ තත්ත්වය තුල එක්සත් ජනපදය, සිය යෝජනාව හකුලා ගැනීමට තීරනය කල අතර, එය අවසාන යෝජනා තුලට ඇතුලත් නොවීය. ඒ වෙනුවට ප්‍රකාශනය කියා සිටියේ, ජාමූඅ ප්‍රතිසංස්කරන පිලිබඳ ප්‍රශ්නය එලඹෙන ජාමූඅ සමුලුව තුල තීරනය කරනු ඇති බවයි.

සැලකිල්ලට භාජනය වන කරුනු අතරින් ප්‍රධාන කොටම අවධානය යොමුවනු ඇත්තේ, ගෝලීය ආර්ථිකය ප්‍රති තුලනය කිරීම වෙත බවට, සමුලුව ආසන්නයේදී කල ඔබාමා පාලනාධිකාරයේ අවධාරනය, ජර්මන් චාන්සලර් ඇන්ජිලා මර්කෙල් විසින් හෙලා දුටුවාය. ජර්මනිය හා චීනය යන දෙරටම මෙය සලකනු ලබන්නේ, එක්සත් ජනපදය විසින් සිය දැවැන්ත හිඟයන් ගේ බර තමන් මත පැටවීමටත්, වෙලඳ හා ජංගම ගිනුමේ අතිරික්තයන්ට තුඩුදෙන පරිදි අපනයන නැඹුරුවකින් යුත් තම ආර්ථිකයන්ට පහර දීමටත් දරන උත්සාහයක් ලෙසයි.

සිය පාර්ශවයෙන් ජර්මනිය හා ප්‍රන්සය, මූල්‍ය හා ආර්ථික අර්බුදයේ වගකීම වෝල් වීදියේ කර මත තැබීමේ හා තමන්ගේම බැංකු ක්ෂේත්‍රයේ ආසක්තයන් පෙරට ගෙනයාම සඳහා එක්සත් ජනපද බැංකු ක්‍රමවේදය අපකීර්තියට පත්වීමේ වාසිය ඩැහැ ගැනීමේ උත්සාහයක් ලෙස, බැංකු පිලිබඳ ගෝලීය නියාමනයක් හා බැංකුකරුවන්ගේ දීමනා මත සීමාවන් පැනවීම ප්‍රධාන මාතෘකා කර ගැනීමට සහාය ගොනුකිරීමේ යෙදී සිටියේය.

"අප, බාල අනුකරනයේ ප්‍රශ්න දෙස බලමින් මූල්‍ය වෙලඳපොල නියාමනය පිලිබඳ මාතෘකාව අමතක නොකල යුතුය" යි මර්කෙල් ප්‍රකාශ කලාය.

සැලකිල්ලට ලක්වූ තවත් ප්‍රශ්නයක් වූයේ, වෝල් වීදියට ඇප දීමේ දැවැන්ත එක්සත් ජනපද ව්‍යාපෘතියේ කොටසක් වශයෙන් සිය යුරෝපීය සගයන්ට වඩා දැනටමත් ඉහල සංචිත ලඟ තබාගෙන සිටින ඇමරිකානු බැංකු වලට විශේෂිත වාසි සලසන පරිදි, බැංකු වලට, සැලකිය යුතු ඉහල ප්‍රාග්ධන සංචිත තබා ගැනීමට  බලකල යුතු බවට එක්සත් ජනපදය කරන ඉල්ලීමයි. අවසන් ප්‍රකාශය, ප්‍රාග්ධන සංචිත නියමයන් පිලිබඳ තීරනය කිරීම, 2012 අග දක්වා කල් දමා තිබේ.

බැංකු විධායකයන්ගේ දීමනා පිලිබඳ කාරනයේදී ප්‍රන්සය හා ජර්මනිය, වන්දි ගෙවීමට ඇබ ගැසිය යුතුය යන ඉල්ලීම, එක්සත් ජනපදයේ දැඩි විරුද්ධත්වය හමුවේ අතහැර දැමීමට එකඟ වූහ. ඒ වෙනුවට ප්‍රකාශනය බැංකු වලින් ඉල්ලා සිටියේ, සීමාරහිත අවදානම් දැරීම අධෛර්යමත් කිරීමක් වශයෙන් වැටුප් හා පාරිතෝෂික ප්‍රතිව්‍යුහගත කරන ලෙසත්, දිගු කාලීන කර්තව්‍යයන් කෙරෙහි අවධානය යොමුකරන ලෙසත් ය. සම්බාධක පැනවීමකින් තොර, බලගැන්වීමේ යාන්ත්‍රනයකින් තොර මෙය, බලයක් නොදරන ඉල්ලීමක් පමනකි.

ව්‍යුත්පන්නයන් පිලිබඳ සීමිත නියාමනය, කාබනික ඉන්ධන සඳහා සහනාධාර අවසන් කරන බවට දුන් අවිනිශ්චිත පොරෙන්දුව, වතාවතක් ලෙස කෙරෙන ආරක්ෂනවාදය ප්‍රතික්ෂේප කිරීම, ආන්ඩුවල උත්තේජක හා බැංකු ඇප දීමේ වැඩසටහන් අවසන් කිරීමේ එකඟතාවන්, ඉහල යන විරැකියාව, සාගින්න හා දරිද්‍රතාවයට විසඳුම් දීමේ පොරොන්දු යන අනෙක් යෝජනා මාලාව, ශක්තිමත්, තිරසාර හා සමතුලිත වර්ධනය සඳහා ආකෘතියක් ලෙස අවසන් ප්‍රකාශනයෙන් හැඳින්වූ දේ තුලට රිංගවා තිබුනි.

එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය එක්ව ඉදිරියට තල්ලු කල ඊනියා "ආකෘතිය," එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය වැනි හිඟයන් සහිත රටවල් දේශීය පරිභෝජනය අඩුකර අයවැය හා වෙලඳ හිඟයන් කපාහල යුතු බවටත්, චීනය, ජපානය හා ජර්මනිය වැනි අතිරික්තයක් සහිත රටවල් ඔවුන්ගේ වෙලඳ හා ජංගම ගිනුමේ අතිරික්තයන් පහත හෙලා දේශීය ඉල්ලුම නැංවිය යුතු බවටත් ඉල්ලා සිටියේය.

"ආකෘතිය" යටතේ ජී 20 රටවල්, ජාමූඅ සහයෝගය ඇතිව එකිනෙකාගේ කටයුතු සමාලෝචනය කල යුතු අතර, තමන්ගේ අසමතුලනයන් අඩුකර ගැනීමට අපොහොසත්වන සාමාජිකයන්ට එරෙහිව බලපෑම් සහගත පීඩනය යෙදවිය යුතුය. චීනය හා ජර්මනිය යන දෙරටම ආරම්භයේදී මෙම යෝජනාවට විරුද්ධ වූ අතර, අත්සන් තැබීමට එකඟ වූයේ ජාමූඅ ට මැදිහත්වීමේ බලතල නොදෙන බවටත්, අනුකූලව කටයුතු කිරීමට අසමත් වන රටවලට එරෙහිව දඬුවම් හෝ සම්බාධක නොපනවන බවටත් සහතික වීමෙන් පසුව පමනකි.

බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව හා චීනය යන ඊනියා බීආර්අයිසී රටවල් "සමතුලිත වර්ධනයේ ආකෘතිය මත එක්සත් ජනපදයට එරෙහිව ප්‍රසිද්ධියේ සටන් නොවදින මුත්, ඔවුන් සුපරීක්ෂාකාරී වන අතර ප්‍රකාශනයට අත්සන් තැබීමට එකඟ වනු ඇත්තේ එයට විධිමත් පරිදි බලය පවරා නැති නිසා පමනි." *ෆිනෑන්ෂල් ටයිම්ස්* එසේ ලිවීය.

හිටපු ජාමූඅ නිලධාරියෙකු හා කෝනෙල් හි මහාචාර්ය වරයෙකු වන එස්වාර් ප්‍රසාද් ප්‍රකාශ කල බව සඳහන් කරමින් පුවත්පත මෙසේ පැවසීය. "ජාමූඅ සුපරීක්ෂාකාරී ක්‍රියාවලිය, තමන්ගේම ජාත්‍යන්තර ආර්ථික පිලිවෙත පෙරට ගෙනයාම සඳහා එක්සත් ජනපදයට යලි අවස්ථාව උදාකර දෙනු ඇතැයි, බීආර්අයිසී කනස්සල්ලට පත්ව සිටියි."

"ආකෘතිය," ලෝක ආර්ථික ඉතිහාසයේ සැතපුම් කනුවක් ලෙස සමහර නායකයන් විසින් හුවා දැක්වීය. බ්‍රිතාන්‍ය අගමැති ගෝර්ඩන් බ්‍රවුන් මෙසේ පැවසීය. "මෙම ග්‍රහලෝකයේ ජනගහනයෙන් තුනෙන් දෙකක් නියෝජනය කරමින්, මේ පිට්ස්බර්ග් හි රැස්ව සිටින නායකයන් රැකියා, වර්ධනය (ආර්ථික) හා තිරසාර ආර්ථික පුනර්ජීවනයක් වෙනුවෙන් එකඟවී ඇත."

අනෙකුත් ප්‍රකාශකයන් ගත්තේ වඩා නිවුනු ආස්ථානයකි. "සම්බාධක නොමැතිව මේ සම්මුතියෙන් කිසිවක් ප්‍රකාශ නොකෙරෙයි. රටවල්, වෙනස්කම් ගැන ඔහේ කථාකරනු ඇති අතර, ප්‍රකාශ නිකුත් කරයි." එසේ ප්‍රකාශ කලේ මේරිලන්ඩ් විශ්ව විද්‍යාලයේ අර්ථශාස්ත්‍රඥ පීටර් මොරිසි ය. "ප්‍රති තුලනයේ" ආකෘතියට සැබෑ අන්තර්ගතයක් තිබෙන තාක් දුරට එහි කඩ ඇනය වන්නේ, එක්සත් ජනපද පාරිභෝජනයේ නිර්දය කප්පාදුවයි. ඔබාමා පරිපාලනය, ලෝකයේ ප්‍රධාන සංචිත මුදල ලෙස එක්සත් ජනපද ඩොලරයට ඇති විශ්වාසනීයත්වය ද ඇතුලු එහි ධනවාදයේ ගෝලීය ආධිපත්‍යය, ඇමරිකානු කම්කරු පන්තියේ ජීවන තත්ත්වයන් තියුනු ලෙස කප්පාදු කිරීම සමඟ බද්ධ කර තිබේ.

වොෂින්ටනයේ ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව පිලිබඳ පීටර්සන් ආයතනයේ වානිජ්‍ය විශේෂඥයෙක් වන ගැරී හොෆ්බවර් *වෝල් ස්ට්‍රීට් ජර්නලයට* පැවසුවේ "ජී 20 ප්‍රති තුලන ක්‍රියාවලිය රඳා ඇත්තේ, ආන්ඩුවේ වියදම් තියුනු ලෙස කපාහැරීමත් බදු වැඩි කිරීමත් වැනි සිය පොරොන්දු ඉටුකිරීමට, පලමුවෙන්ම එක්සත් ජනපදය දක්වන කැමැත්ත මතය." යනුවෙනි.

ඔබාමා හෝ ජී 20 යන කවරෙකුත්, වැටුප්, පාරිභෝජනය හා ආන්ඩුවේ සමාජ පිරිවැය පහත හෙලීම, ඔවුන්ගේ රැකියා බිහිකිරීම හා දුප්පත්කම තුරන් කිරීම පිලිබඳ සාඩම්බර වාගාලාප සමඟ ගැලපෙන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට උත්සාහයක් දැරුවේ නැත.

ජී20 යෝජනා තුල බැරෑරුම් ලෙස බැංකු නියාමනය කිරීමේ හෝ සමපේක්ෂනය හා වංචාව පාලනය කරන්නේ කෙසේද යන්න ගැන වචනයක් වත් සඳහන් නොවේ. කර්මාන්ත නගා සිටුවීම හා පලදායී ආයෝජන පුලුල් කිරීම, විශේෂයෙන්ම එක්සත් ජනපදය තුල, කර්මාන්ත යලි ගොඩනැගීමේ සහ නිෂ්පාදන ආයෝජන දෙසට යොමුවූ කිසිවක් එහි අඩංගු වන්නේ ද නැත. වැඩකරන ජනසමූහයේ රැකියා හා ජීවන තත්ත්වයන් විනාශවීම නතරකිරීමේ හා ලෝක ධනවාදයේ බිඳවැටීම මඟින් සිදු කල සමාජ ව්‍යසනයට සහන සැලසීමක් පිලිබඳ කිසිදු පියවරක් ගැන සිතා බැලීමක්වත් නැත.

ඒ වෙනුවට, ලෝකයේ මූල්‍ය ප්‍රභූ පැලැන්තීන්ට ඇප දීමේ ප්‍රතිපලයක් වශයෙන් ගොඩගැසී ඇති දැවැන්ත රාජ්‍ය නය මගින් තෙල් වක්කරනා ලද, පිලිමල් ජාතික ධනේශ්වර කන්ඩායම් අතර වෙලඳපොලවල් හා ලාභ ශ්‍රම මූලාශ්‍ර වල පාලනය සඳහා වන ගැටුම, උත්සන්න වනු ඇත. පසුගිය නොවැම්බරයේ පැවති ප්‍රථම ජී 20 සමුලුවෙන් පසුව වඩාත් උග්‍ර වී ඇති ආරක්ෂනවාදය, තව තවත් දැඩි වනු ඇත. ඒ සමඟ සෑම රටකම කම්කරු පන්තියට වඩ වඩාත් දරුනු ප්‍රහාර එල්ල කෙරෙනු ඇත.

© www.wsws.org